**සීමාසහිත හලාවත වැවිලි සමාගම - 2015**

**-----------------------------------------------------**

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදුකිරීමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. ඉහත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ඉහත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක විගණන වාර්තාවක් 2016 අප්‍රේල් 28 දින සමාගමේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරන ලදී.

**1.2 සමාගම පිහිටුවීම හා එහි අයිතිය**

**-----------------------------------**

රාජ්‍ය සංස්ථා හා රජය සතු ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරන පනත ප්‍රකාරව, සීමාසහිත හලාවත වැවිලි සමාගම (CPL) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සීමිත වගකීම් සමාගමක් වන අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කරන ලදී. මෙය සම්පූර්ණයෙන් රජය සතු සමාගමක් වන අතර මහා භාණ්ඩාගාරයේ ලේකම් සමාගමේ තනි කොටස් හිමිකරු වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“අධ්‍යක්ෂ මණ්ඩලය”) වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා  පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට සීමාසහිත හලාවත වැවිලි සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මූ වා ප්‍ර) අනුකූල වීම

--------------------------------------------------------------------------

**ශ්‍රී ලං මූ වා ප්‍ර 5 - විකිණීම සඳහා පැවති ජංගම නොවන වත්කම් හා අත්හිටවූ මෙහෙයුම් අත්හිටුවීම :** වෙන්දේසියට ඉදිරිපත් කරන ලද වාහනවලින් අත්ට්‍රැක්ටර් 5 ක්, යතුරු පැදි 4 ක්, ට්‍රැපර් 1 ක් හා කුඩා බැකෝ යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂය තුළ විකුණා නොතිබුණි. කෙසේ වුවද ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව, මෙම වාහන විකිණීමට ඇති වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

විගණනයේදී පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පශු සම්පත් පිළිබඳ සාධාරණ අගය තක්සේරු කිරීමෙන් හඳුනාගන්නා ලද වාසිය රු.2,168,000 ක් වූ අතර පශු සම්පත් ආරම්භක ශේෂයට සාපේක්ෂව එය සියයට 29 ක වැඩිවීමක් විය. තවද, පශු සම්පත් මියයාම් හේතුවෙන් පශු සම්පත්වල සියයට 10 කට ආසන්න අඩුවීමක් නිරීක්ෂණය විය. එබැවින්, සමාගම විසින් කරන ලද තක්සේරු කිරීම පිළිබඳව විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී පොල්ගස් විකිණීමෙන් උපයන ලද ආදායම රු.19,682,141 ක් විය. කෙසේ වුවද, අපහරණ අවස්ථාවේදී පොල් ගස් වල වටිනාකම සමාගම විසින් හඳුනාගෙන නොතිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය - 8.9 ඡේදය | ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමෙන් පසු දින 15 ක් ඇතුළත අවසාන ලාභාංශ ගෙවීම සිදුකළ යුතුය. කෙසේ වුවද සමාගම එම විධිවිධානවලට අනුකූල වී නොතිබුණි. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය | ජාතික තරඟකාරී ලංසු පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දෙන ලද කාලපරිච්ඡේදය දින 21 ක් වුවද, සමාගමේ කාර්යමණ්ඩලය සඳහා නිල නිවාස ඉදිකිරීමට ලංසු කැඳවීම සඳහා සමාගම දින 14 ක් පමණක් ලබා දී තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.85,782,509 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ පාඩුව රු.61,272,891 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු.147,055,400 ක වර්ධනයක් දැක්වුණි. පොල් විකිණීමෙන් හා වෙනත් ආදායම වැඩිවීම හේතුවෙන් ආදායම වැඩිවීම සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සමාගමේ වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| | 2015 | 2014 |
|---|---|---|
| දළ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 37 | 40 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 4.74:1 | 4.11:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන) | 3.82:1 | 2.80:1 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ආදායම රු.24,515,355 කින් වැඩි වී තිබුණද, දළ ලාභ ආන්තිකයේ අඩුවීමක් වාර්තා කර තිබුණි.

(ආ) සමාගම විසින් අතිරික්ත කාරක ප්‍රාග්ධනය දිගුකාලීන ආයෝජන ප්‍රභවයන්හි ආයෝජනය කිරීමෙන් තොරව අඛණ්ඩව පවත්වා ගෙන තිබූ බවත් ඒ අනුව සමාගමේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය ඉතා දූර්වල බවත් නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රගති වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම හා විගණනයට ඉදිරිපත් කරන ලද වෙනත් තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ඉලක්කයන් කිහිපයක් හා ඒවා ඉටුකර ගැනීම් පහත දැක්වේ.

| විෂයය | ඉලක්ක | ඉටුකර ගැනීම | ඉලක්කයන්වල ප්‍රතිශතයක් ලෙස ඉටුකර ගැනීම් |
|---|---|---|---|
| පොල් ඵලදාව (ගෙඩි මිලියන වලින්) | 16.11 | 12.52 | 77.72 |
| එක් ගසකට සාමාන්‍ය ඵලදාව (ගෙඩි) | 72 | 43 | 59.72 |

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 2 ක් සඳහා සමාගමට අයත් වැවිලි ප්‍රදේශ වතුයායන් 06 ක පොල් නිෂ්පාදනය, එක් ගෙඩියකට දායකය හා ශුද්ධ විකුණුම් සාමාන්‍යය පහත දැක්වේ.

| **වතුයාය** | **නිෂ්පාදනය** | | | **එක් ගෙඩියකට දායකය** | | | **ශුද්ධ විකුණුම් සාමාන්‍යය (NSA)** | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **2015** | **2014** | **2013** | **2015** | **2014** | **2013** | **2015** | **2014** | **2013** |
| | ගෙඩි මිලියන | ගෙඩි මිලියන | ගෙඩි මිලියන | රු. | රු. | රු. | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| බිංගිරිය - නිකවැරටිය | 2.4 | 2.3 | 1.5 | 13.60 | 12.41 | 6.58 | 30.13 | 29.41 | 25.46 |
| හලාවත | 2.1 | 1.7 | 0.8 | 14.58 | 12.11 | (0.48) | 29.19 | 28.58 | 26.26 |
| දිවුලපිටිය | 1.6 | 1.8 | 1.8 | 16.07 | 17.84 | 23.73 | 34.69 | 35.03 | 36.31 |
| මාදම්පේ | 1.2 | 1.9 | 1.8 | 2.27 | 9.98 | 12.85 | 31.03 | 29.46 | 29.53 |
| පළුගස් වැව | 3.9 | 3.6 | 2.5 | 14.73 | 12.67 | 12.53 | 29.30 | 27.89 | 28.16 |
| පුත්තලම - මංගල එළිය | 1.4 | 1.7 | 1.1 | (0.50) | 4.86 | 1.45 | 26.13 | 26.12 | 23.46 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 හා 2015 වර්ෂ තුළදී පුත්තලම, මංගලඑළිය ප්‍රදේශ වතුයායෙන් සමාන ශුද්ධ විකුණුම් සාමාන්‍යයක් (NSA) වාර්තා කර තිබුණද, 2015 වර්ෂයේදී ඍණ දායකයක් වාර්තා කර තිබුණි.

(ii) 2015 වර්ෂයේදී දිවුලපිටිය, මාදම්පේ හා පුත්තලම - මංගලඑළිය ප්‍රදේශ වතුයායේ පොල් ඵලදාව ගෙඩි 1,134,097 කින් අඩු වී තිබුණි.

## 4.2 මෙහෙයුම් දුර්වලතා

### 4.2.1 ප්‍රධාන නිෂ්පාදන වලින් ආදායම

ප්‍රධාන නිෂ්පාදන විෂයයන්ගෙන් ලැබුණු ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව පහත දැක්වේ.

| **නිෂ්පාදනය** | **2015** | **2014** | **විචලනය [හිතකර/ (අහිතකර)]** | |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| පොල් | 367 | 322 | 45 | 14 |
| කොප්පරා | 32 | 52 | (20) | 40 |
| කජු | 0.1 | 5.9 | (5.8) | 98 |
| වී | 2.4 | 2.3 | 0.1 | 3 |
| පොල් ගස් විකිණීම | 19.7 | 8.7 | 11 | 128 |
| පොල් ලෙලි හා පොල්කටු | 7.0 | 7.7 | 0.7 | 9 |
| ලුණු ඉවත්කරන ටැංකිය | 12.6 | - | 12.6 | 100 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කොප්පරා හා කජු වලින් ලද ආදායම රු.මිලියන 25.6 කින් අඩු වී තිබුණි.

(ආ) සමාගමේ තිබෙන මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 8 කින් පමණ සමන්විත වූ කුඹුරු ඉඩම් හෙක්ටයාර් 432 කින් රු.මිලියන 2.4 ක ආදායමක් පමණක් උත්පාදනය කර තිබුණි.

(ඇ) වෙනත් වතුවල කජු නිෂ්පාදනය වැඩි වී තිබුණද, තම්බපණ්ණි වතුයායේ කජු නිෂ්පාදනය 2015 වර්ෂයේදී කිලෝග්‍රෑම් 10,757 කින් පහත වැටී තිබුණි.

### 4.2.2 ගම්මිරිස් වගා ව්‍යාපෘතිය

-------------------------

ගම්මිරිස් වගාවේ සැලකිය යුතු පහත වැටීම හේතුවෙන් ගම්මිරිස් විකිණීමෙන් ලද ආදායම 2014 වර්ෂයේ රු.1,219,760 සිට 2015 වර්ෂයේ රු.466,050 දක්වා පිරිහී තිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2.3 පොල් එකතුකිරීම

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිනකට වැටෙන ගෙඩි සංඛ්‍යාවේ සාමාන්‍යය 28 ක් වුවද, දිනකට වැටී තිබුණු ගෙඩි සංඛ්‍යාව 88 ක් බව විගණනයේදී නිරීක්ෂණය විය. එබැවින් වැටුණු ගෙඩි සංඛ්‍යාවෙන් සියයට 68 කින් ආදායම අඩුවීමක් දැක්වුණි.

(ආ) 2015 ජනවාරි 12 දින සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී අවස්ථා 8 කදී ගෙඩි 1,562 ක අතිරික්තයක් හා අවස්ථා 5 කදී ගෙඩි 165 ක ඌනතාවයක් අනාවරණය විය. කළමනාකරණය විසින් පොල් එලදාව නිරවද්‍යව ගණනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩු දෙන විෂයයන්

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජල ගැලීම්වලට පාත්‍ර වූ ජනතාව අතර බෙදා හැරීම සඳහා අවශ්‍ය පිරිම් ඇඳුම් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.3,275,000 ක මුදලක් ගෙවා තිබූ අතර එය ව්‍යාපාර ප්‍රවර්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙය වෙනත් මෙහෙයුම් වියදම් වලින් සියයට 24 ක් විය. එසේම මෙම ගනුදෙනුව ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් වලට සෘජුවම අදාළ නොවීය. තවද මෙම ගනුදෙනුව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී නොතිබූ අතර අනුමත ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුවෙන්ද එය තහවුරු නොවීය.

(ආ) මාදම්පේ ප්‍රදේශ වතුයායේ ග්ලිරිසීඩියා පැල 5,000 ක් රෝපණය කිරීම සඳහා සමාගමේ ශ්‍රමිකයන් යොදවා තිබුණද, මෙම කාර්යය සඳහා පුද්ගලික පාර්ශවයකට රු.10,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) තම්පණ්ණි ප්‍රදේශ වතුයායේ කාර්යභාර නිලධාරීවරයා 1995 වර්ෂයේදී වැඩ තහනමකට ලක් වී තිබූ අතර, සමාගමේ කළමනාකාරීත්වය විසින් ගන්නා ලද සාවද්‍ය තීරණයක් හේතුවෙන් ලැබුණු උසාවි නියෝගය පරිදි සමාලෝචිත වර්ෂය තුළ නැවත සේවයේ පිහිටුවා රු.1,036,163 ක හිඟ වැටුප් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළුගස්වැව තෙල් මෝල් මෙහෙයුම්වලින් රු.153,791 ක පාඩුවක් සමාගම විසින් දරා තිබූ අතර මෙම ක්‍රියාවලිය ලාභදායී තත්ත්වයකට පරිවර්තනය කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) තම්බපණ්ණි ප්‍රදේශ වතුයායේ අංක 1 හා අංක 2 ඇතුළත් කොප්පරා කිලෝග්‍රෑම් 176 ක ඌනතාවයක් භෞතික සමීක්ෂණයේදී අනාවරණය වූ අතර තවත් කොප්පරා කිලෝග්‍රෑම් 125 ක් ප්‍රතික්ෂේපිත තත්ත්වයේ විය. මෙම පාඩු සඳහා හේතු හඳුනාගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) වංචා විමර්ශන කාර්යාංශයට කරන ලද පැමිණිල්ලට අනුව, බිංගිරිය ප්‍රදේශ වතුයායේ පොල් ගෙඩි 207,333 ක් වංචා සහගතව විකිණීම හේතුවෙන් එය රු.5,390,658 ක මූල්‍ය වංචාවක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැවිලි), වතු අධිකාරීවරයා හා කාර්ය භාර නිලධාරිවරයා ඇතුළු නිලධාරීන් තිදෙනෙකුගේ රාජකාරී අත්හිටුවා තිබුණි. කෙසේ වුවද, නීත්‍යානුකූල නොවන පරිදි පොල් විකිණීම පිළිබඳ අවදානම අඩුකිරීම සඳහා විධිමත් පද්ධති හා පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීමට හා නියාමනය කිරීමට පියවර ගෙන නොතිබුණි. ගසකට සියයට 4 සිට සියයට 28 දක්වා පරාසයක වූ අඩු වාර්ෂික පොල් එලදාවක් හලාවත හා තම්පණ්ණි ප්‍රදේශ වතුයායන්හි ක්ෂේත්‍ර 14 ක් වාර්තා කර තිබූ බව විගණනයේදී පෙන්වා දී තිබුණද, කළමනාකාරීත්වය විසින් මේ සම්බන්ධයෙන්ද ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ඈ) තම්බපණ්ණි ප්‍රදේශ වතුයායේ 2013 වර්ෂයේ සිට පැවති මැරී ගිය තේක්ක ගස් දෙකක් නිල නිවාස ඉදිකිරීම සඳහා යොදා ගැනීමට උපදෙස් දී තිබුණද, අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව පැවතුණි.

**4.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

විගණනයේදී හඳුනාගන්නා ලද තේක්ක දැව ගස් දෙකක් හා වෙනත් වටිනා ගස් වර්ග වන කළමනාකරණ ලේඛනයේ හා පරිභෝජ්‍ය ජෛව විද්‍යාත්මක වත්කම් වටිනාකම්වලට ඇතුළත් කර නොතිබුණි.

**4.6 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගම විසින් නිවාඩු දිනයන්හි අතිකාල ගෙවීමෙන් තොරව ශ්‍රමිකයන් වැඩෙහි යොදවා තිබුණි. එබැවින් කම්කරු උසාවිය විසින් සමාගමට එරෙහිව නඩු තීන්දුවක් ලබා දී තිබුණි.

(ආ) සමාගම විසින් පුහුණුවන්නන් තිදෙනෙකු හා කාර්යාල සහකරුවකු දෛනික වේතන පදනම මත සේවයේ යොදවා තිබුණි. කෙසේ වුවද එම තනතුරු සඳහා පුරප්පාඩු විගණනයේදී හඳුනාගත නොහැකි විය.

(ඇ) කළමනාකරණ සහකරුවකු ලෙස පුද්ගලයකු බඳවා ගෙන රු.24,017 ක සියල්ල ඇතුළත් මාසික වැටුපක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. ඉදිරියේදී අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ සිංහල හා ඉංග්‍රීසි සඳහා සම්මාන සාමාර්ථයක් ලබාගැනීමට යටත්ව මෙම බඳවා ගැනීම සිදුකර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

සංයුක්ත සැලැස්මට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණද, 2015 වර්ෂය තුළ ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ඉලක්ක සහිතව කළමනාකරුවන්ගේ වගකීම් හඳුනා ගැනීමට සමාගමට නොහැකි වී තිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **නිරීක්ෂණය** |
|---|---|
| (අ) බැංකු ගිණුම පිළිබඳ පාලනය | නිකුත් කර මාස 6 කට වැඩි කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් නොකරන ලද චෙක්පත් පිළිබඳ කටයුතු කිරීම අවශ්‍ය වේ. |
| (ආ) කොප්පරා මධ්‍යස්ථානය මෙහෙයවීම | මධ්‍යස්ථානය විසින් භාරගනු ලබන පොල් ගෙඩි, ගණන් කිරීමෙන් තොරව භාරගැනීම් පත්‍රිකාවේ සටහන් කිරීම. |